VERITÉ
විදසුන්

Originally Published in: [, , ]

## අයවැය ප්‍රධාන වශයෙන්ම මුදල් පිළිබඳව නොව, යහපාලනය පිළිබඳ වැදගත් මිණුම් දණ්ඩකි

අයවැය යනු ජාතික සැලසුම්, ප්‍රමුඛතා සහ ප්‍රතිපත්ති මෙහෙයවනු වනු ලබන පාලන ක්‍රියාවලියකි. මෙයින් බහුතරය අයවැය අන්තර්ගතය තුළින් පිළිබිඹු වන අතර වැදගත් රාජ්‍ය පාලනයක ස්වරූපයද අයවැය ක්‍රියාවලිය තුළින් පිළිබිඹු වේ. මේ දක්වා වූ නව රජයේ 2016 අයවැය ක්‍රියාවලිය පසුගිය වර්ෂ වලට සාපේක්ෂව රාජ්‍ය පාලනය පිළිබඳ මිණුම් දණ්ඩක් ලෙස ධනාත්මක වෙනසක් පෙන්නුම් කිරීමට අසමත් වී ඇති බව මෙවර විදර්ශනාව මඟින් පෙන්නුම් කෙරේ.

### විවෘත අයවැය - අතීතය

විවෘත අයවැය සමීක්ෂණය සැලසුම් කර ඇත්තේ අයවැය ක්‍රියාවලිය පරීක්ෂා කිරීම පිණිසය. මෙම සමීක්ෂණය අයවැය ක්‍රියාවලියේ විනිවිද භාවය තුළින් පාලනය ඇගයීමට ලක් කෙරේ. මෙහිදී එම ක්‍රියාවලියේ පැතිකඩ තුනක් පිළිබඳව සොයා බැලේ; 1) අයවැය ලේඛන මහ ජනතාවට කොතරම් දුරට අනාවරණය කරනවාද? 2) ව්‍යවස්ථාදායකය සහ විගණකාධිපති විසින් ක්‍රියාවලිය කොතරම් දුරට අධීක්ෂණයට ලක් කරනවාද? සහ 3) අයවැය ක්‍රියාවලියට මහජනතාව කොතරම් දුරට සහභාගී වනවාද? ප්‍රතිඵලය විවෘත අයවැය දර්ශකයේ (OBI) ලකුණු සංඛ්‍යාව මඟින් පෙන්නුම් කරයි.

විවෘත අයවැය දර්ශකය ආරම්භයේ (2006) සිට, ශ්‍රී ලංකාවට එහි OBI ලකුණු සංඛ්‍යයාව 47 සිට 2010 වන විට 67 දක්වා වර්ධනය කර ගැනීමට හැකිවී තිබේ. මෙම කාලය තුළ අයවැය වටා වූ පාලන ක්‍රියාවලිය සුභවාදී ස්වරූපයක් පෙන්නුම් කර ඇත. එහෙත් 2012 දී , ලකුණු 46 දක්වා ලකුණු සංඛ්‍යයාවේ විශාල පහත වැටීමක් දක්නට ලැබුණු අතර, 2015දී ප්‍රකාශයට පත් කරන ලද විවෘත අයවැය දර්ශක අගය ඊටත් වඩා දරුණු ලෙස 39 දක්වා පහළ වැටී තිබේ. 2015 වන විට ශ්‍රී ලංකාව ලෝකයේ සාමාන්‍ය දර්ශක අගය වන 45 ටත් වඩා පසුපසින් සිටි. මෙම දර්ශකයෙන් තක්සේරුවට භාජනය වූ රටවල් 102 ක් අතරින් ශ්‍රී ලංකාව දැනට පසුවනුයේ 69 ස්ථානය තරම් පහළ ස්ථානයක වේ. මෙම සමීක්ෂණයෙන් පෙන්වා දෙනුයේ ශ්‍රී ලංකාව, ජනතාවට 'අවම' වශයෙන් අයවැය තොරතුරු අනාවරණය කරනු ලබන රටක් මෙන්ම අයවැය ක්‍රියාවලිට මහජනතාවගේ සහභාගීත්වය අඩු රටක් බවයි. 2015 සමීක්ෂණය පදනම් කරගෙන ඇත්තේ 2014 අයවැය ක්‍රියාවලිය වේ.

### විවෘත අයවැය - වර්තමානය

2015 පසු භාගයේදී ඇරඹෙන 2016 අයවැය වර්ෂයට අදාළ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකාවේ මේ සම්බන්ධ ගැටලුකාරී අතීතයේ වැරදි යළිත් කරළියට රැගෙන එනු දක්නට ලැබේ. උදාහරණ ලෙස, අයවැය පිළිබඳ මහජනතාවට කළ යුතු අනාවරණ ප්‍රකාරව රජයේ අපේක්ෂිත ආර්ථික හා අයවැය ඉලක්ක ඉස්මතු කර දක්වන පූර්ව අයවැය ප්‍රකාශය, විසර්ජන පනත් කෙටුම්පතට පෙර ප්‍රකාශයට පත් නොවිය.

අයවැය ක්‍රියාවලිය තුළ මහජනයා සහභාගීකර ගැනීම අයවැය යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මුදල් අමාශය විසින් මහජනයා වෙත කරන ලද ඉල්ලීමට පමණක් සීමා විය. එපමණක් නොව මහජනතාවගේ යෝජනා අයවැයට සංකලනය වනුයේ කෙසේද හෝ ඇතැම් යෝජනා ප්‍රතික්ෂේප වූයේ කුමන හේතුවක් නිසාද යන්න පිළිබඳව පෙන්නුම් කිරීමට ප්‍රතිචාර යාන්ත්‍රණයක් පිළිබඳ සඳහනක් මෙම ඉල්ලීම තුළ නොවීය. එසේම වත්මන් අයවැය චක්‍රය 2015 දී ක්‍රියාත්මක කිරීමේදී රජයේ කාර්ය සාධනය පිළිබඳව මහජනතාවගේ කිසිදු සහභාගීත්වයක් නොතිබිණ.

### විවෘත අයවැය - ඉදිරි ගමන් මඟ

තේරී පත් වූ රජයකට තම පුරවැසියන් අරභයා මූලික වගකීම් දෙකක් තිබේ. ප්‍රථම වගකීම නම් රටේ අනාගතය වෙනුවෙන් තම සැලසුම් ප්‍රකාශයට පත් කිරීමත්, දෙවන වගකීම නම් ඒවා ඉටු කරලීම වෙනුවෙන් ක්‍රියාත්මක වීමත්ය. මෙම පොරොන්දු දීමත් ඒවා ඉටු කිරීමත් පිළිබඳ ඇගයීමක් කළ හැකි වනුයේ රජයේ ක්‍රියාකාරකම් වලට අදාළ තොරතුරු ජනතාව සතුවේ නම් පමණි. එබැවින් නිරවද්‍ය තොරතුරු වල කාලීන අනාවරණය, නිසි අධීක්ෂණය හා ඒ පිළිබඳ මහජන ප්‍රතිචාර රාජ්‍ය පාලනය කෙරේ තීරණාත්මක බලපෑමක් ඇති කරයි. ඒ නිසාවෙන්ම විවෘත අයවැය සමීක්ෂණය මඟින් මේවා ඇගයීමට භාජනය කෙරේ.

අයවැය ක්‍රියාවලිය වටා පාලනය වැඩි දියුණු කිරීම පිණිස ශ්‍රී ලංකාවට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් තිබේ. (2 රූපසටහන බලන්න)

(1) අදාළ ලේඛන නියමිත කාලයට ප්‍රකාශයට පත් කිරීම. මනා පාලන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය අයවැය ආශ්‍රිත ලේඛන 8 න් 6 ක් දැනට ශ්‍රී ලංකාව ප්‍රකාශයට පත් කරයි. එහෙත් 6න් 3ක්ම ඉතා ප්‍රමාද වී ප්‍රකාශයට පත් කිරීම හේතුකොට ගෙන ඒවා ප්‍රයෝජනවත් නොවන ලේඛන ලෙස නොසළකා හැරේ. ඊට අමතරව ප්‍රකාශ කරන ලද තොරතුරු වල අදාළතාව / ගුණාත්මකභාවය පිළිබඳ අඩුපාඩුකම්ද දක්නට ලැබේ.

(2) පුරවැසි අයවැය ප්‍රකාශයට පත් කරනු ලැබීම. අයවැය ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී පුරවැසි අයවැය ප්‍රසිද්ධියට පත්කළ හැක. මෙයින් අදහස් වන්නේ දැනට පවතින අයවැය ලේඛනය සරල කර ඉදිරිපත් කිරීම (e.g. අයවැය ඇස්තමේන්තු හෝ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව වැනි) හෝ පොදු ජනතාව දැනුවත් කිරීම සඳහා සරල අයවැය තොරතුරු ඇතුළත් ඕනෑම ලියවිල්ලක් ප්‍රකාශයට පත් කිරීම වේ.


(3) අයවැය ක්‍රියාත්මක කිරීමේදී මහජනතාවගේ දායකත්වය ලබා ගැනීම. වර්තමානයේදී මහජන උපදෙස් ලබා ගැනීම් සිදුවන්නේ අයවැය සකස් කිරීමේදී පමණක් වේ. නමුත් මහජන සහභාගීත්වය වැදගත් වන තවත් ක්ෂේත්‍රයක් තිබේ. එනම් අයවැය ක්‍රියාත්මක කිරීමේදීය. එහිදී අයවැයෙන් ලබාදුන් පොරොන්දු ඉටු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග වල කාර්යසාධනය (වසර මැද) පිළිබඳ රජය විසින් ජනතාවගේ උපදෙස් විමසනු ලබයි.

විශේෂයෙන් 2008 සහ 2010 අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සමඟ කටයුතු කළ කාලයේදී ශ්‍රී ලංකාව ඉහත සඳහන් සියළු දේ ක්‍රියාත්මක කිරීම තුළින් පෙන්වන්නේ මේවා ක්‍රියාත්මක කිරීමට රජයට හැකියාවක් ඇති බවයි. මෙයින් පැහැදිලි වන්නේ මෙම ක්‍රියාමාර්ග ගැනීමට බාහිර පීඩනයන් මත රදා නොසිට, ශ්‍රී ලංකාව ඇතුළත ආයතනික විනය වර්ධනය කිරීම වැදගත් බවයි.

මහජනයාට තොරතුරු අනාවරණය කිරීම සහ මහජන සහභාගීත්වය පිළිබඳව පවතින වර්තමාන දුර්වලතා සහ මාධ්‍ය වල අයවැය පිළිබඳව එක් කාලයකට පමණක් සීමා වූ අවධානය අතර සබඳතාවක් දැකිය හැක. ශ්‍රී ලංකාව තුළ, මාධ්‍ය තුළ වඩාත්ම අවධානයට ලක්වනුයේ අයවැය අනුමැතිය අදියර (පොරොන්දු ලබාදීමේ අදියර) වන අතර මෙම මූලික අදියරේදීද අයවැය ලේඛන ප්‍රමාදයකින් තොරව ප්‍රකාශයට පත්කරනු ලැබේ. පොරොන්දු ඉටුකර තිබේදැයි පරීක්ෂා කිරීමට කාලය පැමිණි විට, මාධ්‍ය ඒ සඳහා කිසිදු අවධානයක් යොමු නොකරන අතර රජයද ඒ පිළිබඳ සිය වගකීම කඩ කරයි.

විවෘත අයවැය සමීක්ෂණය අයවැය පාලනයේ ගුණාත්මකභාවය පිළිබඳව කරන අනාවරණයකි. අභිනව රජය අයවැය ක්‍රියාවලියේ විනිවිදභාවය වර්ධනය කිරීමට ප්‍රමුඛතාවක් දෙන බවට පෙන්වීමට තවමත් සමත් වී නැත.

**1 රූපසටහන: ශ්‍රී ලංකාවේ අයවැය විනිවිදභාවය පිළිබඳ විවෘත අයවැය දර්ශක අගය**




මූලාශ්‍රය: විවෘත අයවැය සමීක්ෂණය (බහු වාර්ෂික)

2 රූපසටහන: අයවැය ක්‍රියාවලිය තුළ ලේඛන අනාවරණය

